**කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**
**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය (මාර්ගගත), සිවුවන වසර - 2022**

# බුද්ධිමය දේපළ නීතිය (පැය තුනයි)

ප්‍රශ්න සංඛ්‍යාව : 06

**ඕනෑම ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.**
(අපැහැදිලි අත්අකුරු වලට ලකුණු අඩු කෙරේ)

---

1. මහේල යනු ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ වෙළඳ ප්‍රචාරණ සමාගමක් වන ට්‍රෙන්ඩ් ඩිසයිනර්ස් ආයතනයට අනුයුක්තව සේවය කරන නිර්මාණශීලී සැලසුම් නිර්මාණකරුවෙකි. රට තුළ පවතින ඉන්ධන අර්බුදය හමුවේ, ට්‍රෙන්ඩ් ඩිසයිනර්ස් ආයතනයේ පරිපාලනය විසින් මහේල ඇතුළු බොහෝ සේවකයන්ට නිවසේ සිට වැඩ කරන ලෙස දැනුම් දෙන ලදී. ඔහුගේ රැකියා විස්තරයට අනුව, වෙළඳ ප්‍රචාරණ අරමුණු සඳහා භාවිතා කළ හැකි ඕනෑම සාහිත්‍ය, කලාත්මක හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක නිරත වීමට මහේලට නියම කර ඇත. මහේල නිවසේ සිට වැඩ කරන අතරතුර, ශ්‍රී ලංකාවේ දේශීය සබන් නිෂ්පාදනයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මිනිත්තු 15-20 ක වීඩියෝ පටයක් නිර්මාණය කිරීමට භාවිතා කළ හැකි නිර්මාණාත්මක කතාවක් රචනා කරන ලදී. ප්‍රධාන වශයෙන් යූ ටියුබ් පදනම් කරගත් ප්‍රවර්ධන වැඩසටහන් නිර්මාණය කරන ස්වාධීනව නිර්මාණකරණයේ යෙදෙන නිෂ්පාදකයෙකුට (freelance), සැලකිය යුතු මුදලකට, වෙනත් ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා එය භාවිතා කිරීමට මහේල අවසර දුන්නේය. මෙම නිර්මාණාත්මක කතාව ගොඩනැගීමේදී මහේල, සමාගම විසින් ඔහුට ලබා දුන් ලැප්ටොප් පරිගණකය භාවිත කර ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක් නිර්මාණය කිරීමේදී ඕනෑම නිෂ්පාදකයෙකුට උපකාර වන සහ මඟ පෙන්වන, කතාවේ දළ රූපසටහන් කිහිපයක් ද සකස් කරන ලදී. නිෂ්පාදකයා විසින් මුල් කතාවට සිදු කරන ලද යම් යම් වෙනස් කිරීම් වලින් අනතුරුව, ආකර්ෂණීය ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක් දක්වා වර්ධනය වූ එය දැන් වේගයෙන් යූ ටියුබ් ප්‍රේක්ෂකයන් අතර ප්‍රචලිත වෙමින් පවතී.

නිවසේ සිට වැඩ කරන කාලය ඇතුළත මහේල කෙටිකතා කිහිපයක් ද ලියා ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රකාශන සමාගමක් වන විදුර ප්‍රකාශකයින්, මෙම කෙටිකතා ඔවුන්ගේ ඉදිරි ප්‍රකාශනයේ පළ කිරීමට බලාපොරොත්තුවෙන් සිටී. අදාළ ප්‍රකාශනයෙහි එම කෙටිකතා පළ කිරීමට මහේල ප්‍රකාශකයන් හට අවසර දෙන ලදී.

නිවසේ සිට වැඩ කරන කාලය තුළ මහේල විසින් නිර්මාණය කරන ලද ඉහත සඳහන් කෘති දෙක සඳහාම ට්‍රෙන්ඩ් ඩිසයිනර්ස් ආයතනය විසින් ප්‍රකාශන හිමිකම් ඉල්ලා සිටී.

ඉහත ප්‍රකාශිත තත්වය තුළ පවත්නා නීතිමය ගැටළු හඳුනාගෙන අදාළ පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 100)

2. ආචාර්ය මායා, ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ ඖෂධ පර්යේෂණ ආයතනයක් වන සීමාසහිත රූබි ෆාමසියුටිකල්ස්හි හෘද රෝග පර්යේෂණ ඒකකයට අනුයුක්තව පූර්ණ කාලීන සේවකයෙකු ලෙස සේවය කරන විද්‍යාඥවරියකි. දිගු කාලීන පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස, ඇය විසින් හදිසි හෘද ආබාධ, හෘද පේශි රෝග සහ ධමනි අධි රුධිර පීඩන තත්වයන් සඳහා වන ක්ෂණික ඖෂධීය ප්‍රතිකාරයක් ලෙස භාවිතා කළ හැකි *මොනර මල්* සහ *හීන් බෝවිටියා* ශාකවලින් නිස්සාරණය කරන ලද ස්වභාවික අමුද්‍රව්‍ය කිහිපයකින් මෙන්ම තවත් රසායනික අමුද්‍රව්‍ය කිහිපයකින් සමන්විත වන මුඛයේ දමා හැපීමට හැකි කරලක් නිපදවා ඇත. ඇය දැනටමත් මෙම කරල නම් කර ඇත්තේ ‘බෝවිටෝල්’ යනුවෙනි. බෝවිටෝල් හි කාර්යක්ෂමතාවය (efficacy) දැනට වෙළඳපොලේ ඇති වෙනත් කිසිදු ඖෂධයකට වඩා ප්‍රතිඵලදායක වේ. තවද, මෙම ඖෂධය සායනික අත්හදා බැලීම් කිහිපයකට ලක් කර ඇති අතර එහිදී බෝවිටෝල්හි කාර්යක්ෂමතාවය පිළිබඳව වෛද්‍යවරුන් මවිතයට පත් වී ඇත. වෛද්‍ය ක්ෂේත්‍රයේ ඇතැම් ප්‍රවීණයන් පවසන්නේ බෝවිටෝල්, සමස්ත වෛද්‍ය ක්ෂේත්‍රයේම ප්‍රධාන සන්ධිස්ථානයක්

වන බවත් එය ලොව පුරා බොහෝ රෝගීන්ගේ ජීවත්වීමේ අපේක්ෂාව වැඩි කරන බවත් ය. සීමාසහිත රූබි ෆාමසියුටිකල්ස්හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙම පර්යේෂණයේ කැපී පෙනෙන ප්‍රතිඵලවල ප්‍රගතිය සමාලෝචනය කිරීමෙන් අනතුරුව, ඇයට අඛණ්ඩව පසුගිය වසර හතරක් සඳහා විශේෂ පර්යේෂණ දීමනාවක් ද පිරිනමා ඇත. ආචාර්ය මායා දැන් ශ්‍රී ලංකාව තුළ ඇයගේ නව නිපැයුම සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරයි. කෙසේ වෙතත්, රූබි ෆාමසියුටිකල්ස් සමාගම තර්ක කර සිටින්නේ අදාළ නව නිපැයුම සඳහා පේටන්ට් අයිතිය ඉල්ලා සිටීමට ඔවුන්ට අයිතිය ඇති බවයි. මේ අතර, ශ්‍රී ලංකාවේ වෛද්‍ය වෘත්තිකයන් සමඟ මෑතකදී පැවති රැස්වීමකදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ බලධාරීන් විසින් ජනතාවට දැරිය හැකි මිලකට ඖෂධ සඳහා ප්‍රවේශය සහතික කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත.

ඉහත දක්වා ඇති තොරතුරු මත පදනම්ව පහත ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

i. ඔබ, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පේටන්ට් සම්බන්ධ නීතිඥයෙකු බවත් ආචාර්ය මායා උපදෙස් ලබාගැනීම සඳහා ඔබ වෙත පැමිණ ඇති බවත් උපකල්පනය කරන්න. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පනතේ අදාළ විධිවිධාන මත පදනම්ව, පේටන්ට් බලපත්‍රයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේදී ඇයට මුහුණ දීමට සිදු විය හැකි නීතිමය බාධාවන් ඉස්මතු කරමින් ඇයගේ නව නිපැයුම සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීමට ඇයට ඇති හැකියාව සම්බන්ධව උපදෙස් ලබා දෙන්න.

(ලකුණු 60)

ii. බහුජාතික සමාගමක් වන ඔර්ලන්ඩෝ සමූහය ලොව පුරා මෙම නව නිපැයුම වාණිජකරණය කිරීමට සහ මහා පරිමාණයෙන් බොවිටෝල් කරල් නිෂ්පාදනය කිරීමට අපේක්ෂාවෙන් සිටී. *හීන් බෝවිටියා* යනු ශ්‍රී ලංකාවට ආවේණික ශාකයක් වන අතර පෘථිවියෙන් වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති ශාක අතුරින් එකක් ලෙස සැලකේ. ඔබ ඔර්ලන්ඩෝ සමූහය විසින් පත් කරන ලද නීති උපදේශකවරයා යැයි උපකල්පනය කරන්න. බොවිටෝල් කරල් වාණිජකරණය කිරීමට අවශ්‍ය පූර්වාවශ්‍යතා හඳුනා ගැනීමට සහ ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටි ඔවුන්ගේම කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කරන

අතරතුර ලොව පුරා බොව්ටෝල් කරල් වාණිජකරණය කිරීමට බාධාවක් තිබේද යන්න තීරණය කිරීමට ඕර්ලන්ඩෝ සමූහයට සහාය වන්න.

(ලකුණු 40)

(මුළු ලකුණු 100)

3. **A** සහ **B** යන කොටස් **<u>දෙකටම</u>** පිළිතුරු සපයන්න.

(A) ඔබ ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයට අනුයුක්ත වෙළඳ ලකුණු පරීක්ෂකයෙකු යැයි උපකල්පනය කරන්න. ඔබ වෙත ඉදිරිපත් කර ඇති පහත සඳහන් අයදුම්පත් ලියාපදිංචි කිරීමේ හැකියාව පිළිබඳව ඔබගේ හේතු සඳහන් කළ අදහස දක්වන්න:

i. ජංගම දුරකථන සහ ටැබ්ලට් පරිගණක සඳහා 'SUNSUN' යන වචනයෙන් සමන්විත ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා සචිනි විසින් අයදුම්පතක් ගොනු කර ඇත. කෙසේ වෙතත්, ලොව පුරා කීර්තිමත් සන්නාමයක් වන සහ දිගු කලක් තිස්සේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අලෙවි කරන SUNSUN හි හිමිකරු විසින් SUNSUN ලකුණ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීම සඳහා තවමත් අයදුම්පතක් ඉදිරිපත් කර නොමැත.
සචිනි විසින් ඇඳුම් ආයිත්තම් සඳහා 'SUNSUN' ලකුණ ලියාපදිංචි කිරීමට උත්සාහ කළහොත් ඔබේ පිළිතුර වෙනස් වේද?

(ලකුණු 30)

ii. ළදරු සබන් නිෂ්පාදනයක් සඳහා 'BABY-SOFT' යන ලකුණ ලියාපදිංචි කිරීම සඳහා ටෙහාන් විසින් අයදුම්පතක් ගොනු කර ඇත.

(ලකුණු 20)

(B) රොජර්, TEZQUELLA FOOD යන ලියාපදිංචි ලකුණේ හිමිකරු වේ. ඔහු 2015 වසරේ සිට ශ්‍රී ලංකාව තුළ ආහාර බෙදා හැරීමේ සේවාවකට අදාළව ඉහත සඳහන් ලකුණ භාවිතා කරයි. මිහින් විසින් TEZQUILLO FOOD යන ලකුණ යටතේ

අවන්හල් සේවාවක් ක්‍රියාත්මක කිරීම මෙම වසරේ ජනවාරි මාසයේදී ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාව තුළ බලාත්මක අදාළ නීති තත්වය  මත පදනම්ව රොජර්ට ලබා ගත හැකි අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම සාකච්ඡා කරන්න.

(ලකුණු 50)

(මුළු ලකුණු 100)

4. 'ඇතැම් නව නිපැයුම් ආරක්ෂා කිරීම සඳහා පවත්නා විකල්ප නීති දේහයන් ලෙස පේටන්ට් බලපත්‍ර නීතිය සහ වෙළඳ රහස් පිළිබඳ නීතිය සැළකිය හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නව නිපැයුම්කරුවෙකුට බොහෝ විට තමා ආරක්ෂාව පැතිය යුත්තේ කුමණ නීති දේහයක් මගින් ද යන්න පිළිබඳ තේරීමක් හෝ වරණයක් කිරීමට සිදු වේ. 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත මගින් අනාවරණය නොකළ තොරතුරු සඳහා ව්‍යවස්ථාපිත ආරක්ෂාව සපයයි. කෙසේ වෙතත්, පොදු නීති ප්‍රතිකර්ම තවදුරටත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මගින් බලපෑමට ලක් නොවී පවතී.'

අදාළ නෛතික මූලධර්ම, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න. ඔබගේ විශ්ලේෂණය මගින් වෙළඳ රහස් සම්බන්ධ පාලනය සිදු කරන ශ්‍රී ලංකා නීති තත්වය, ජාත්‍යන්තර බැඳීම්, අභියෝග, සුවිශේෂී අවස්ථාවන් සහ ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ සඳහා වන නිර්දේශ තිබේ නම් ඒවා කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය.

(ලකුණු 100)

5. **A** සහ **B** යන කොටස් <u>**දෙකටම**</u> පිළිතුරු සපයන්න.

(A) නිකලස්, ළමා සෙල්ලම් බඩු සැලසුම් කර නිෂ්පාදනය කරන Kiddies Rovella නම් සමාගමක සෙල්ලම් බඩු නිර්මාණකරුවෙකු ලෙස කටයුතු කරයි. නිකලස් විසින් නෙළුම් කුළුණක හැඩැති සෙල්ලම් ගඩොල් (a building block) ඒකකයක් නිර්මාණය කරන ලද අතර එම සෙල්ලම් ගඩොල් ඒකකයේ නෙළුම් මලෙහි පෙති ඇති මුහුණතෙහි විචිත්‍ර බොත්තම් ඇණ එබ්බුම් පෙළවල් දක්වා ඇත. ගොඩනැගිලි ඒකකයේ අනෙකුත් සෙල්ලම් ගඩොල් සමඟ එකලස් කිරීමේ හැකියාව වඩාත් තහවුරු කිරීම සඳහා එවැනි හැඩයක් අවශ්‍ය බැවින් එම බොත්තම් ඇණ සිලින්ඩරාකාර හැඩයකින් යුක්තව සකසා ඇත.

2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනතේ විධිවිධාන යටතේ කාර්මික සැලසුමක් ලෙස ඉහත සඳහන් සෙල්ලම් ගඩොල් නිර්මාණය ලියාපදිංචි කිරීමේ හැකියාව පිළිබඳව Kiddies Rovella වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 50)

(B) 'බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් දැනට පවත්නා අන්තර්ජාතික නීති පද්ධතිය (international instruments) ජාතික තලයේ නෛතික රාමුන් සඳහා පදනම් කරගත හැකි මූලික සිද්ධාන්ත පිළිබඳව වන වැදගත් මූලාශ්‍රයන් සපයයි.'

කාර්මික සැලසුම් පාලනය කරන අන්තර්ජාතික නීති පද්ධතිය (international instruments) ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 50)

(මුළු ලකුණු 100)

6. **A** සහ **B** යන කොටස් **<u>දෙකටම</u>** පිළිතුරු සපයන්න.

(A) 2022 වර්ෂයෙහි ශ්‍රී ලාංකාවේ තත්කාලීන පාරිභෝගික සුභසාධන සංසද සම්මන්ත්‍රණයට පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට ඔබට ආරාධනා කර ඇතැයි උපකල්පනය කරන්න. පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කිරීම සඳහා ඔබට ලැබී ඇති මාතෘකාව වන්නේ 'අසාධාරණ තරඟයට එරෙහි ආරක්ෂාව සම්බන්ධ නීතිය මගින් ශ්‍රී ලංකා නීති පසුතලය තුළ කූඨ නිදේශනය (Passing off) සම්බන්ධ නඩුකරයන්ගේ භූමිකාව නොවැලක්විය හැකි ලෙස හීන කරයි' යන්නයි.

ඔබගේ ඉදිරිපත් කිරීම මගින් ඉහත සඳහන් කළ නීති ක්ෂේත්‍ර පාලනය කරන ශ්‍රී ලංකා නීති තන්ත්‍රයේ තාර්කික එළඹුම, විෂය පථය, කැපී පෙනෙන ලක්ෂණ, ශක්තීන් සහ දුර්වලතා කෙරෙහි අවධානය යොමු කිරීම සිදු කළ යුතුය. අදාළ නෛතික විධිවිධාන, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු ඇතුළු නෛතික අධිකාරීන්ට අදාළව ඔබේ පර්යේෂණ පත්‍රිකාව කෙටුම්පත් කරන්න.

(ලකුණු 70)

(B) 'භූගෝලීය දර්ශක (GIs) ආරක්ෂා කිරීමේ තාර්කික පදනම ද අනෙකුත් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ තාර්කික පදනමට සමාන බව හඳුනාගෙන ඇති අතර, එය පදනම් වී ඇත්තේ පොදු යහපත උදෙසා දැනුම/තොරතුරු භාවිත කිරීමේ අවශ්‍යතාවය සහ යමෙකුගේ කීර්තිය මතින් ලබාගන්නා අයුතු ප්‍රතිලාභය (free riding) මගින් ඇති වන හානිය ද මත ය.'

ඔබ, ඉහත ප්‍රකාශය සමග එකඟ වන්නෙහි ද? භූගෝලීය දර්ශක සම්බන්ධ ආරක්ෂාවේ තාර්කික පදනම සහ වැදගත්කම ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය කෙටියෙන් සාකච්ඡාවට ලක් කරන්න. ඔබගේ පිළිතුර සඳහා අදාළ නෛතික මූලධර්ම, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන, සහ උදාහරණ ආශ්‍රය කර ගන්න.

(ලකුණු 30)

(මුළු ලකුණු 100)

***********************